සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි.

**(i)** සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

---

- පහත දක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ආශ්‍රයෙන් අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇඳී ඉරක් ලෙසේ
සත්තක මගෙ පුතුගෙ යසේ
නෙත් දෙක හැර බලන් මෙසේ

(ii) වඩිගපුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
කල වඩිග පටුනින් - මෙසේ බමුණෝ යාග කරමින්

(iii) යකෂණිය - පීකොක්, තීරෝස්, බිස්ටල්, නන්දසේන, පොඩි අප්පුහාමි, පියසේන
යකැදුරා - එක දරුවෙක් වඩාගෙන නම් කීයක් කියෙව්වද? හරි වැඩක් නේද බොල.
යකෂණිය - ඡන්දෙට, ඡන්දෙට කරන්න ගිහින් තමයි මට වැරදුණේත්, තාත්තලා ගොඩයි

(iv) ගැහැණු වෙස්ගත් ඇදුරා - ගුරුන්නාන්සේ හේතක් කොටලා කපු ඇට ඉහලා ඒවායින් පැළයක් ඇවිල්ලා හඳක් පෑව්වා වගේ ලස්සනට බබලන මලක් පිපිලා තියෙනවා. දැන් ඉතින් මොනවද කරන්න ඕන.
ගුරුන්නාන්සේ - කපු නෙළා ගන්න ඕන.
ගැහැණු වෙස් ගත් ඇදුරා - ඔව් ඔව් උඩුගුවනේ ඉඳගෙන කපු නෙළන්න ඕනෑ.

(01) ගර්භ සෙත් ශාන්තිය සඳහා කරනු ලැබූ ශාන්ති කර්මයට අයත් පද්‍යයක් ඇතුලත් වන්නේ,

(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

(02) මෙහි එන සූනියම් යාගයට අයත් පද්‍ය/ගද්‍ය ඛණ්ඩය ඇතුලත් වන්නේ,

(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

(03) සන්නියකුම ශාන්ති කර්මයට අදාල පද්‍ය/ ගද්‍ය ඛණ්ඩය ඇතුලත් වන්නේ,

(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

(04) රිද්දි බිසව් සිවුරක් සකස් කොට, දීපංකර බුදුන්ට පූජා කිරීම පිළිබඳ කතා පුවත ඇතුලත් ගද්‍ය/පද්‍ය ඛණ්ඩය ඇතුලත් වන්නේ,

(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

(05) කතන්දරයකින් නාට්‍යයක් වෙනස් වන්නේ,

(1) සජීවී බවිනි.
(2) කියවා රස විඳීමට පමණි.
(3) සාමූහික බවිනි.
(4) ගබඩා කිරීමේ ඇති හැකියාවෙනි.

(06) "චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීමේ නළු කාර්යය" හඳුන්වනු ලබන්නේ,

(1) අනුකරණය නමිනි. (2) අභිරූපණය නමිනි. (3) රූපණය නමිනි. (4) නිරූපණය නමිනි

(07) ස්වභාවික චලනයක් යනු,

(1) ස්වභාවික පරිසරයේ සිදුවනු ලබන චලනයන් අනුකරණය කිරීමකි.
(2) එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොරව සිදු කරන චලනයකි.
(3) උත්සාහයකින් යුතුව සිදුකරනු ලබන චලනයකි.
(4) නාට්‍යයකට ස්වභාවික පරිසරයෙන් එකතු කරනු ලබන චලනයකි.

(08) නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ දී අවධානය යොමු කල යුතු ප්‍රධානතම කරුණ වන්නේ,

(1) නළුවරණයට ය.
(2) වේදිකා කළමණාකරනයට ය.
(3) ආනුෂංගික අංග වලට ය.
(4) මුද්‍රිත පිටපතට ය.

(09) රංග ක්‍රීඩාවල යෙදීමෙන් රූපණ ශිල්පියාගේ,

(1) ආශ්වාස ප්‍රාශ්වාසය පහසු වේ.
(2) අභිනය මැනවින් භාවිතා වේ.
(3) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වේ.
(4) විවිධ ශබ්ද හඳුනා ගැනීමේ හැකියාව ලැබේ.

(10) දෘශ්‍ය මාධ්‍ය ලෙස සැලකෙන්නේ,

(1) චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය, චිත්‍ර ය.
(2) චිත්‍ර, මූර්ති, කැටයම් ය.
(3) බැලේ, මුද්‍රා, මූර්ති ය.
(4) චිත්‍ර, මූර්ති, මුද්‍රා නාට්‍ය ය.

(11) රූපණය පුහුණුවීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කලයුතු අංග දෙක වන්නේ,

(1) අභ්‍යන්තරික ප්‍රකාශනය සහ බාහිර ප්‍රකාශනය වේ.
(2) චලන හා හස්ත මුද්‍රා වේ.
(3) වේදිකා භාවිතය සහ නර්තනය වේ.
(4) ආනුෂංගික අංග භාවිතය හා අධ්‍යක්ෂණය වේ.

(12) තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරනු ලබන චලන රටා හඳුන්වන්නේ,

(1) ප්‍රකෘති චලන නමිනි. (2) පරිකල්පන චලන නමිනි.

(3) නිර්මිත චලන නමිනි. (4) තාලානුකූල චලන නමිනි.

(13) ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ,

(1) අතිශයෝක්තියෙන් යුතුව ඉදිරිපත් කෙරෙන රංගනයයි.

(2) වේදිකා අලංකරණය අතිශෝක්තියෙන් සිදු කිරීමයි.

(3) ස්වාභාවික තත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.

(4) යථාර්ථය ඒ වූ ලෙසට ම වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.

(14) නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීතය අයත් වන අභිනය පිළිවෙළින්,

(1) ආහාර්ය අභිනය හා වාචික අභිනය යි. (2) වාචික අභිනය හා ආහාර්ය අභිනය යි.

(3) සාත්වික අභිනය හා ආංගික අභිනය යි. (4) වාචික අභිනය හා සාත්වික අභිනය යි.

◆ පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 15 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතියේ නම | මුල් රචකයාගේ නම | පරිවර්තන / අනුවර්තනයේ නම | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| ද ඩ්‍රැගන් | එව්ගිනි ෂ්වාත්ස් | ක | හෙන්රි ජයසේන |
| ග | සොෆොක්ලීස් | බෙර හඬ | බන්දුල ජයවර්ධන |
| ද හෝස් | ජ | තුරඟ සන්නිය | සුගතපාල ද සිල්වා |
| ද ජස්ට් | ඇල්බෙයා කැමූ | විනිශ්චය | ට |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | ඩ | සුගතපාල ද සිල්වා |

(15) ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුලත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?

(1) මකරා (2) ජනේලය

(3) පුස්ලෝඩං (4) තට්ටු ගෙවල්

(16) ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුලත් විය යුතු මුල් කෘතියේ නම කුමක් ද?

(1) ඉර්මා ලාඩුස් (2) මරාසාද්

(3) චරන්දාස් (4) ඉක්නෙවුටා ඉ

(17) ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුලත් විය යුතු මුල් රචකයාගේ නම කුමක් ද?

(1) ටෙනසි විලියම් (2) ජුලියස් හේ

(3) ඇරිස්ටොෆනීස් (4) ෂෙරිඩන්

(18) ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුලත් විය යුතු මෙරට නිෂ්පාදකගේ නම කුමක් ද?

(1) පරාක්‍රම නිරිඇල්ල (2) සයිමන් නවගත්තේගම

(3) බන්දුල ජයවර්ධන (4) ජැක්සන් ඇන්තනි

(19) ඉහත වගුවේ 'ඩ' කොටුවට ඇතුලත් විය යුතු අනුවර්තන/පරිවර්තනයේ නම කුමක් ද?

(1) අහස් මාලිගා
(2) පව්කාරයෝ
(3) සුදු සහ කළු
(4) හිත හොඳ අම්මණ්ඩි

(20) නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයා දක්වා නළු නිළියන් විසින් ගෙන යාම සිදුකරනු ලබන්නේ,

(1) සතර අභිනය මගිනි.
(2) ආනුෂංගික අංග මගිනි.
(3) චරිත නිරූපණ මගිනි.
(4) වේදිකා කළමණාකරණය මගිනි.

(21) චරිත නිරූපණයේ දී වඩා වැදගත් කරුණක් වන්නේ,

(1) තාලාන්විත බව ය.
(2) රිද්මයානුකූල බව ය.
(3) නිර්මාණශීලී චින්තනයයි.
(4) රූමත් බව ය.

(22) පිටපතකින් තොරව සීමිත කාලයක දී යම් කිසි අවස්ථාවක් නිරූපණය කිරීම

(1) අභිරූපණයයි.
(2) ක්ෂණික නිරූපණයයි.
(3) අනුකරණයයි.
(4) අනුරූපණයයි.

(23) නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කරන්නේ,

(1) ආනුෂාංගික ශිල්පීන් විසිනි.
(2) වේදිකා පරිපාලක විසිනි.
(3) අධ්‍යක්ෂවරයා විසිනි.
(4) අර්ථපති විසිනි.

(24) 'අභිනය' යන්නෙන් අදහස් කරන්නේ,

(1) නාට්‍ය පෙළ යන්නයි.
(2) වේෂ භූෂණ යන්නයි.
(3) රඟපෑම යන්නයි.
(4) ඉදිරියට පැමිණවීම යන්නයි.

(25) ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන් යනු,

(1) රූපවාහිනී නාට්‍ය, බැලේ, මුද්‍රා නාට්‍ය ය.
(2) චිත්‍ර, මූර්ති, කැටයම් ය.
(3) මුද්‍රා නාට්‍ය, ඔපෙරා, චිත්‍ර ය.
(4) කැටයම්, මූර්ති හා කාටූන් ය.

◆ පහත ඡායාරූප ඇසුරෙන් ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

(26) මෙහි 'ක' ඡායාරූපයෙන් දැක්වෙන රංග ශිල්පිනිය වන්නේ,

(1) අනුලා බුලත්සිංහල ය.
(2) මානෙල් ජයසේන ය.
(3) කෞශල්‍යා ප්‍රනාන්දු ය.
(4) මැනිකේ අත්තනායක ය.

(27) වේදිකාව, සිනමාව, රූපවාහිනිය සහ ගුවන්විදුලිය යන අංශයන්හි රංගනයේ යෙදුනු ජනප්‍රිය ම රංගන ශිල්පියා දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

(28) නාට්‍ය රංගනය හා අධ්‍යක්ෂණය යන අංශ දෙකෙහි ම නියුතු රංගන ශිල්පියා දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ඡ' ය. (4) 'ට' ය.

(29) 1967 දී වේදිකා රංගනයට පිවිසි මහාසාර, රතු හැට්ටකාරි වේදිකා නාට්‍යවල ප්‍රබල භූමිකාවක් ඉදිරිපත් කල රූපණ ශිල්පිණිය දැක්වෙන්නේ,

(1) 'ක' ඡායාරූපයේ ය. (2) 'ග' ඡායාරූපයේ ය.

(3) 'ජ' ඡායාරූපයේ ය. (4) 'ට' ඡායාරූපයේ ය.

(30) වේදිකා නාට්‍ය ඉතිහාසයේ වැඩි ම වාර ගණනක් 'පොතේ ගුරු' චරිතය රඟ දැක්වූ රංග ශිල්පියා දැක්වෙන්නේ,

(1) 'ක' ඡායාරූපයේ ය. (2) 'ග' ඡායාරූපයේ ය.

(3) 'ජ' ඡායාරූපයේ ය. (4) 'ට' ඡායාරූපයේ ය.

(31) විවිධ සංගීත ඛණ්ඩ ශ්‍රවණය කොට, ඒ සඳහා සකසනු ලබන චලන සඳහා භාවිතා කරන නම වනුයේ,

(1) ප්‍රකාශනාත්මක චලන ය. (2) රිද්මයානුකූල චලන ය.

(3) සංවිධිත චලන ය. (4) ප්‍රසංගාත්මක චලන ය.

- පහත දැක්වෙන වගුව ඇසුරින් ප්‍රශ්න අංක 32 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| මනමේ<br>සිංහබාහු | කැළණි පාලම<br>බෝඩිංකාරයෝ | අන්දර මල්<br>සීතාම්බර පට | සුභ සහ යස<br>දෝන කතරිනා |

(32) ඓතිහාසික කතා පුවත් ඇසුරෙන් රචිත නාට්‍ය අඩංගු කාණ්ඩය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

(33) නාට්‍ය ධර්මී රංග ශෛලියෙන් නිෂ්පාදනය වූ නාට්‍ය යුගලය අයත් කාණ්ඩය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

(34) ලෝක ධර්මී රංග ශෛලියෙන් නිෂ්පාදනය වූ නාට්‍ය යුගලය අයත් කාණ්ඩය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

(35) ජන කරළිය ජංගම රඟමඩුල තුල නිෂ්පාදනය කරන ලද නාට්‍ය කාණ්ඩය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

(36) සමකාලීන සමාජ ප්‍රශ්න හා ගැටළු තේමා කොට ගෙන නිෂ්පාදනය වූ නාට්‍ය යුගලය අයත් කාණ්ඩය වන්නේ,

(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

- ප්‍රශ්න අංක 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

(37) චරිතයක් නිරූපණය කිරීමේ දී සැලකිලිමත් වීම අත්‍යාවශ්‍ය නොවිය යුතු ක්ෂේත්‍රයකි.

(1) නළුවරණය (2) අවකාශ භාවිතය

(3) අවස්ථා නිරූපණය (4) ගායන හැකියාව

(38) නාට්‍ය පෙළක් කියවීමේ දී සැලකිය යුතු නොවන්නේ,

(1) පෙළ රචකයා සහ කතා වස්තුව පිළිබඳව ය.

(2) ශෛලිය හා තේමාව පිළිබඳව ය.

(3) චරිත ස්වභාවය හා එහි ජීවගුණය පිළිබඳව ය.

(4) රංග විධාන හා විරාම ලක්ෂණ හි වැදගත්කම ය.

(39) නාට්‍යමය අවස්ථාවක ඇති ගුණාංගයක් නොවන්නේ,

(1) ගැටුමක් සහිත අවස්ථාවක් තිබීම ය.

(2) සමාජයට පණිවිඩයක් දීම ය.

(3) චරිත ප්‍රශ්නයකට මුහුණ දී තිබීම ය.

(4) කුතුහලාත්මක බවක් අන්තර්ගතව තිබීම ය.

(40) ක්ෂණික නිරූපණ ප්‍රගුණ කිරීමේ දී ලැබෙන ඵලයක් නොවන්නේ,

(1) තම හැකියා වර්ධනය කර ගැනීම ය.

(2) නිර්මාණාත්මක සිදුවීම් ගොඩ නැංවීම ය.

(3) අභිනය මැනවින් භාවිතය ය.

(4) පෙළ රචනා කිරීමට හැකිවීම ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

"පළමුවැනි ප්‍රශ්නය" හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) දික්තල කාලගෝල නාට්‍යයේ රචකයා කවු ද?

(2) මෙම නාට්‍ය සඳහා මූලාශ්‍ර කොටගත් කතා පුවත ඇතුලත් වන ප්‍රශ්නය කුමක් ද?

(3) මෙම නාට්‍යයේ එන නඩුව විසඳීමට ඉදිරිපත් වන්නේ කවරෙක් ද?

(4) දික්තලාව ලබා ගැනීමට ඇගේ දෙමව්පියන්ට කාලගෝල කල සේවය කුමක් ද?

(5) නාඩගම් සම්ප්‍රදායට අනුව පූර්ව රංගයේ දී ඉදිරිපත් කරනු ලබන චරිතය නම් කරන්න.

(6) නාට්‍ය ආරම්භයේ දී පොතේ ගුරු සහ අත්වැල් ගායක කණ්ඩායම විසින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 12)

(02) (1) නෘත්ත යනු කුමක් ද? (ලකුණු 03)

(2) නෘත්ත හා නෘත්‍ය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

(3) නාට්‍ය කලාව, නෘත හා නෘත්‍යයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (1) රංග අභ්‍යාස යනු කුමක් ද? (ලකුණු 03)

(2) ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 04ක් නම් කරන්න. (ලකුණු 04)

(3) නළුවෙකුට රංග අභ්‍යාසවල යෙදීමෙන් වර්ධනය කරගත හැකි ගුණාංග 05ක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (1) අංග රචනය සඳහා භාවිතා කරන මුහුණේ ප්‍රධාන කලාප ගණන නම් කරන්න. (ලකුණු 03)

(2) අංග රචනයේදී අඳුර සහ එළිය පිළිබඳ මූලධර්මය වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

(3) අංග රචනයෙන් නාට්‍යයකට ඇති ප්‍රයෝජන 05 ක් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(05) (1) රංග භූමිය යනු කුමක් ද? (ලකුණු 02)

(2) නූතන රංග භූමියේ බෙදීම ඇඳ නම් කරන්න. (ලකුණු 04)

(3) රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(06) (1) ආහාර්ය අභිනය යනු කුමක් ද? (ලකුණු 02)

(2) නාට්‍ය සඳහා දායක වන ආනුෂංගික කලාවන් 04ක් නම් කරන්න. (ලකුණු 04)

(3) ඔබ නැරඹූ නාට්‍යයක රංග කාර්යයට දායක වූ ආනුෂංගික කලා ශිල්ප පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කර ගත හැකි ය.

"නිලා සහ සමන්ති පාසලේ එක ම පන්තියේ ඉගෙනුම ලබයි. එදින උදෑසන ම පාසලට පැමිණි ඔවුන් යහලුවන් සමග ක්‍රීඩා පිටියට පිවිසෙන්නේ එදින පැවැත්වීමට නියමිත නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ සැරසිලි කටයුතු සඳහා ය. ක්‍රීඩා පිටිය අසල කඳු පාමුලින් එක්වරම ඇසෙන්නේ මහා ලතෝනි හඬකි. එතැන් සිට....

(1) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

(2) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 06)